# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2404/36 - 2024 ඔක්තෝබර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2024.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 277/1940 (III)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

33 වන වගන්තිය යටතේ වූ නිවේදනය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ-ජනරාල් දැලත් තුසිත මැන්දිස් වන මා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතය සහිතව, මේ නිවේදනය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්යය සඳහා "පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ භූමියක්" විය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**දැලත් තුසිත මැන්දිස්,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ-ජනරාල්

2024 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු "වේරගල මූකලාන" සමන්විත වන භූමි ප්‍රදේශයේ සීමාවන්**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 79, ඇගල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් ඇගල්ල ගමෙහි පිහිටි සහ 1 :4000 පරිමාණයට පදනම්ව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සාදන ලද 2021 අප්‍රේල් සිට 2021 මැයි දිනැති මෙහි පහත දක්වා ඇති අනුරේඛන අංක KE/WRK/2021/73 (අංක A 198 මූලික පිඹුර) හි A, B සහ C යන කැබලි අංක මඟින් නිරූපිත සහ එකී අනුරේඛනයට අනුව හෙක්ටයාර් 12,9883 (අ32 -රූ.-පර්.15.17) ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ සම්පූර්ණ භූමි ප්‍රදේශය.

1A - G 42814 — 05 (2024/10)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) හෙක්ටයාර් 0.4516 (අ1-රූ0-පර්.18.55) ක ප්‍රමාණයකින් සමන්විත එකී කැබලි අංක Aට එකී අනුරේඛනයට අනුව මායිම් -

*උතුරට* - අනුරේඛන අංක KE/WRK/2021/73 හි කැබිලි අංක B;

*නැගෙනහිරට* - මූලික පිඹුරු අංක A111 හි කැබලි අංක 2 සහ 1;

*දකුණට* - කන්දෙහේන; සහ

*බටහිරට* - අනුරේඛන අංක KE/WRK/2021/73 හි කැබලි අංක B;

(ආ) හෙක්ටයාර් 12.0258 (අ29-රූ2-පර්.34.61) ක ප්‍රමාණයකින් සමන්විත එකී කැබලි අංක Bට එකී අනුරේඛනයට අනුව මායිම් -

*උතුරට* - මහහේන;

*නැගෙනහිරට* - කන්දෙහේනේවත්ත, කන්දෙහේන, පීල්ලමුලහේන, කෙහෙල්වතුමුල්ල, මහහේන සහ බෙරවදෙනිය නොහොත් දේවකින්දෙවතුයාය;

*දකුණට* - බෝගහමුලවත්ත; සහ

*බටහිරට* - දේවකින්දෙවතුයාය, ගල්ගේගාවවත්ත, ගල්ගේමුලවත්ත, ගෝනමඩේවත්ත, කලටුවාවේහේන සහ කලටුවාවේවත්ත; සහ

(ඇ) හෙක්ටයාර් 0.5109 (අ1-රූ1-පර්.2.01) ක ප්‍රමාණයකින් සමන්විත එකී කැබලි අංක Cට එකී අනුරේඛනයට අනුව මායිම් -


*උතුරට* - ගල්ගේමුලවත්ත;

*නැගෙනහිරට* - අනුරේඛන අංක KE/WRK/2021/73 හි කැබිලි අංක B;

*දකුණට* - බෝගහමුලවත්ත; සහ

*බටහිරට* - දේවකින්දෙවතුයාය සහ ගල්ගේගාවවත්ත

## TRACING No. KE/WRK/2021/73




EOG 10 - 0042

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.